අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU)

ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද අංක PS/SB/Circular/2/2025 හා 2025 පෙබරවාරි 18 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව, කම්කරු අමාත්‍යාංශයේ අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU) විධිමත් ලෙස ස්ථාපිත කර ඇත.

<u>යෝජනා/ අදහස්/ පැමිණිලි ඉදිරිපත් කිරීම</u>

අපගේ සේවාවේ ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් යෝජනා සහ අදහස් ඉදිරිපත් කිරීමට ඔබට මෙයින් අවස්ථාව ලැබේ.

අපගේ අමාත්‍යාංශය තුළ සිදුවන කිසියම් විෂමතා, දූෂණ හෝ චෝදනා පිළිබඳව ඔබ දැනුවත් වුවහොත්, ඔබට එම තොරතුරු හෝ පැමිණිල්ල අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU) වෙත වාර්තා කළ හැකිය.

⬇ අමාත්‍යාංශ පරිශ්‍රයේ පිහිටා ඇති පැමිණිලි පෙට්ටියට යෝජනා/ අදහස්/ තොරතුරු/ පැමිණිලි යොමු කිරීම.

**තැපැලෙන් යොමු කිරීම**

අභ්‍යන්තර කටයුතු ඒකකය
කම්කරු අමාත්‍යාංශය
6 වන මහල, මෙහෙවර පියෙස, නාරාහේන්පිට
කොළඹ 05

ඊ-මේල් ලිපිනය: iaunit.mol@gmail.com

දුරකථන : 011-2589267

වට්සැප් අංකය : 0707227877

- අභ්‍යන්තර කටයුතු ඒකකයේ ප්‍රධාන අරමුණු
- අභ්‍යන්තර කටයුතු ඒකකයේ (IAU) වගකීම් සහ කාර්යයන්
- අභ්‍යන්තර කටයුතු ඒකකයේ සංයුතිය

**අභ්‍යන්තර කටයුතු ඒකකයේ (IAU) ප්‍රධාන අරමුණු**

සෑම ආයතනයකම අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU) විසින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කෙරේ.

I. ආයතනය තුළ දූෂණය වැළැක්වීම සහ සුපිළිපන්න සංස්කෘතියක් වර්ධනය කිරීම.

II. ආයතනයේ සියලුම ක්‍රියාකාරකම්වල විනිවිදභාවය (Transparency) සහ වගවීම (Accountability) සහතික කිරීම සහ ආයතනික ක්‍රියාකාරකම් සහ තීරණ සම්බන්ධ තොරතුරු වෙත මහජන ප්‍රවේශය සහතික කිරීම.

III. ආයතනය තුළ සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කිරීම.

IV. විෂමාචාර වාර්තා කිරීම දිරි ගැන්වීම, තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීම සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි ක්‍රමවේදයක් සකස් කිරීම.

V. නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විර්මශන කොමිෂන් සභාව (CIABOC) සමඟ සහයෝගයෙන් නීති බලාත්මක කිරීමට සහාය වීම.

**අභ්‍යන්තර කටයුතු ඒකකයේ (IAU) වගකීම් සහ කාර්යයන්**

I. ආයතනය තුළ පවතින පද්ධතිමය බාධාවන් (systemic bottlenecks) හඳුනා ගැනීම සඳහා වත්මන් ක්‍රියා පටිපාටි සහ චක්‍රලේඛ පරීක්ෂා කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඒවා සරල කිරීම.

II. දූෂණ අවදානම් ඇගයීම් (Corruption Risk Assessment) සිදු කිරීම මඟින් ආයතනය තුළ දූෂණයට හා සදාචාර විරෝධී හැසිරීම්වලට ගොදුරු විය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ඉලක්කගත වැළැක්වීමේ පියවර ගැනීම.

III. ආයතනයේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සකස් කරන ලද නිශ්චිත දූෂණ විරෝධී අරමුණු සහ උපායමාර්ග ඇතුළත් ආයතනික සුපිළිපන්න ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

IV. ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම සමඟ ආයතනික ප්‍රතිපත්ති සහ භාවිතයන් පෙළගස්වමින් ජාතික දූෂණ විරෝධී උපාය මාර්ගවලට අනුකූල වීම.

V. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ඇතුළු ජාතික හා ජාත්‍යන්තර දූෂණ විරෝධී නීති සමඟ ආයතනයේ අනුකූලතාව ඇගයීම සඳහා අනුකූලතා සමාලෝචන (Compliance Reviews) සිදු කිරීම සහ වැඩි දියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම.

VI. සියලුම රාජ්‍ය නිලධාරීන් සහ සේවා නියුක්තිකයින් සඳහා වත්කම් ප්‍රකාශන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා නියෝග සහ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට අනුකූලව බැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය කිරීම.

VII. ආයතනය තුළ දූෂණ සහ සදාචාර විරෝධී හැසිරීම් සම්බන්ධ පැමිණිලි භාර ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ආරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීම, එවැනි සියලුම පැමිණිලි සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් හෝ ඒකක විසින් කඩිනමින් කටයුතු කරන බවට සහතික වීම සහ විනිවිදභාවය සහ වගවීම සහතික කරමින් විමසීම් සිදු කරන අදාළ පාර්ශ්වකරුවන් වෙත නිරන්තර යාවත්කාලීන කිරීම් ලබා දීම. අවශ්‍ය පරිදි, දූෂණ විරෝධී පනත යටතේ විමර්ශනය සඳහා අදාළ කරුණු, සොයාගැනීම් හෝ තොරතුරු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කිරීම.

VIII. ආයතනය විසින් සපයනු ලබන සේවාවන් විස්තර කෙරෙන පුරවැසි ප්‍රඥප්තියක් සකස්කර ප්‍රකාශයට පත් කිරීම.

IX. රාජ්‍ය නිලධාරීන් විසින් පිළිපැදිය යුතු ප්‍රමිතිගත ආචාර ධර්ම සංග්‍රහයක් ඇතුළුව සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ බලාත්මක කිරීම.

X. දූෂණ විරෝධී මූලධර්මවලට කැපවී සිටීමට අභිප්‍රේරණයක් ලෙස කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ දැනුවත් කිරීම ඇතුළු අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම.

XI. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ජාතික දූෂණ විරෝධී රාමුව මඟින් මෙහෙයවනු ලබන සුපිළිපන්න ඇගයීම් ක්‍රියාවලින් සඳහා ආයතනය සහභාගී වන බව සහ ඒ සමඟ පෙළගැසෙන බව සහතික කරමින්, ජාතික දූෂණ විරෝධී සුපිළිපන්න ඇගයීම (National Anti-Corruption Integrity Assessment) සඳහා ආයතනික කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම.

XII. ඒකකයේ රාජකාරි ක්‍රියාත්මක කිරීමේදී අඛණ්ඩ මගපෙන්වීම් සහ සහාය ලබා ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම.

XIII. අභ්‍යන්තර කටයුතු ඒකකයෙහි ක්‍රියාකාරකම්, දූෂණ විරෝධී මූලපිරීම්වල ප්‍රගතිය, මුහුණ දෙන අභියෝග සහ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ සාරාංශගත කරමින් කාලානුරූපී සහ වාර්ෂික වාර්තා සකස් කිරීම.

XIV. පුද්ගලික අංශයේ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන්, සුපිළිපන්නතා සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**අභ්‍යන්තර කටයුතු ඒකකයේ සංයුතිය**

අභ්‍යන්තර කටයුතු ඒකකය - කම්කරු අමාත්‍යාංශය
සම්බන්ධීකරණ තොරතුරු

| | අභ්‍යන්තර කටයුතු ඒකකයේ කාර්ය මණ්ඩලය | නිලධාරියාගේ නම | වට්ස්ඇප් අංකය | ඊමේල් ලිපිනය |
|---|---|---|---|---|
| 1 | අභ්‍යන්තර කටයුතු ඒකකයේ ප්‍රධානී | **ටී.පී. මුදිතා පත්මජායි මෙය.** අතිරේක ලේකම් (සංවර්ධන) | 0718123025 | leagl@labourmin.gov.lk |
| 2 | කම්කරු අමාත්‍යාංශයේ සුපිළිපන් නිලධාරි | **පී.ඩී. චන්දන පතිරගේ මයා.** අධ්‍යක්ෂ (සංවර්ධන) | 0712273538 | pstchandana@gmail.com |
| 3 | මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ සුපිළිපන් නිලධාරි | **සී.කේ. විජේමාන්න මිය.** අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 0776182082 | kumudinichampa@yahoo.com |
| 4 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ සුපිළිපන් නිලධාරි | **ඩබ්ලිව්.ඩී.ඩී. වීරතුංග මිය.** පරිපාලන නිලධාරි | 0776911027 | Deepikaweerathunga2@gmail.com |
| 5 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනයේ සුපිළිපන් නිලධාරි | **පී.එම්.සී.කේ. පෙරේරා මයා.** සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 0773956382 | mohan@niosh.gov.lk |
| 6 | ශ්‍රම වාසනා අරමුදලේ සුපිළිපන් නිලධාරි | **එච්.ඩබ්ලිව්. තිලකරත්න මයා.** කළමනාකරු | 0712809917 | Thilak22@hotmail.com |
| 7 | විදේශ සබඳතා අංශයේ සාමාජික | **බී. වසන්තන් මයා.** ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විදේශ සබඳතා) | 071-8249900 | bvasanthan@yahoo.com |
| 8 | ගිණුම් අංශයේ සාමාජික | **එස්.එස්. ශිරෝමා නන්දනී මිය.** ප්‍රධාන ගණකාධිකාරී | 075-2261785 | shiromanandani@yahoo.com |
| 9 | සැලසුම් අංශයේ සාමාජික | **එම්.පී.ඩී.සී. ඩබ්ලිව්.කුමාරි මයා.** නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | 071-6897218 | Kuma_lg@yahoo.com |
| 10 | ප්‍රසම්පාදන අංශයේ සාමාජික | **එස්. ලක්ෂිකා මිය.** සහකාර ලේකම් (ප්‍රසම්පාදන) | 0779265869 | skluxi@gmail.com |
| 11 | නීති අංශයේ සාමාජික | **ඩබ්ලිව්.පී.ජී.ජී. විජේසූරිය මිය.** නීති නිලධාරි | 0763526589 | gayaniew1@gmail.com |
| 12 | මාධ්‍ය ඒකකයේ සාමාජික | **ඩබ්ලිව්.කේ.එස්. කුමාර මයා.** ප්‍රවෘත්ති නිලධාරි | 0718000103 | sarathkalugamage@gmail.com |
| 13 | සාමාජික | **එස්.ආර්. තේනුවර මිය.** සංවර්ධන නිලධාරි | 0712833681 | sawanithenuwara3@gmail.com |
| 14 | සාමාජික | **ඩබ්ලිව්.ජී.ආර්.එච්. වන්නිආරච්චි මිය.** කාර්යාල සේවක සේවය | 0719596380 | hasiniwanniarachchi35@gmail.com |
| 15 | සාමාජික | **ඩබ්ලිව්.ජී.ජී.එස්. සේනාරත්න මයා.** රියදුරු | 0765603863 | Anuradhasanjeewa234@gmail.com |